# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR)

## "Replacing of PLC Controlled Flushing System With New Type In Toilets of S12 DMUS" සඳහා ප්‍රසම්පාදනය

### SRS/F.7809

**ණය අරමුදල් අංක : IDA - 63460**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස CERC ව්‍යාපෘතියෙහි පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක් **"Replacing of PLC Controlled Flushing System with New Type in Toilets of S12 DMUs - SRS/F.7809"** කොන්ත්‍රාත්තුව යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.

02. ඒ අනුව කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, දේශීය නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන් වෙතින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා **"Replacing of PLC Controlled Flushing System with New Type in Toilets of S12 DMUs"** කාර්යය ඉටුකිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

03. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

04. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබාගැනීමත් ලංසු ලේඛන පරීක්ෂා කොට බැලීමත් පහත සඳහන් ලිපිනයේදී පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ, රාජකාරී දිනවල 2022.09.27 දින සිට 2022.10.18 දින දක්වා සතියේ දිනවල, පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ කළ හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94(11)2438078 හෝ 94(11)2436818** |
| **ෆැක්ස් අංක** | : | **94(11)2432044** |
| **ඊමේල්** | : | **dgmp@railways.gov.lk**<br>**pot1@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

05. සුදුසුකම් අවශ්‍යතා අතරට මේවාද ඇතුළත්ය. කාර්මික ස්වයංක්‍රියකරණ වැඩ හෝ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන, දුම්රිය සඳහා හෝ කර්මාන්ත සඳහා නිෂ්පාදනය හෝ සැපයීම සම්බන්ධව ලංසුකරුවන්ගේ පළපුරුද්ද අදාළ වේ. අමතර විස්තර ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත.

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 1,000/= පමණක් ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් 2022.09.27 දින සිට 2022.10.18 දින ප.ව. 3.00 දක්වා මිලදී ගත හැක.

07. සියලුම ලංසු සමග, රුපියල් 26,000/= වටිනාකමින් යුත්, ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් නිකුත් කළ කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

8. මේ සම්බන්ධ පෙර ලංසු හමුවක් 2022.10.05 දින පෙ.ව. 10.30ට රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුවේදී පැවැත්වීමට නියමිතය.

9. ලංසු පහත සඳහන් ලිපිනය වෙත, 2022.10.19 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු අතර, ඒ හා සමගම ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

A.M.U.S. WIJEWARDANA
Procurement Officer (Covering)
Railways Stores Department
Sri Lanka Railways
Colombo 10.